

# SLFRS 15 - ගනුදෙණුකරුවන් සමඟ ගිවිසුම් වලින් ඇතිවන අයභාරය


JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917


ප්‍රමිතයේ අරමුණ
ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් තුලින් ඇතිවන
අයභාරය
මුදල් ප්‍රවාහ
නිර්වචනය
හඳුනාගැනීම
වටිනාකම
හෙළිදරව් කිරීම්
අයභාරය = විකුණුම්කරු ලැබීමට අපේක්ෂා කරන වටිනාකම
මූලධර්ම සැපයීම
ආදායම හඳුනාගැනීමේදී ගිවිසුමේ කොන්දේසි
Sandeepa Jayasekera - JMC
3

3


අයභාරය නිර්වචනය
ව්‍යාපාරයේ
සාමාන්‍ය
ආදායම
Sandeepa Jayasekera - JMC
4

4




5

# ගිවිසුම් තුලින් ඇතිවන ආදායම

Sandeepa Jayasekera - JMC 6

6

JMC vLearning your virtual learning partner

# ගිවිසුමක් යනු

පාර්ශව 2

↓

නෛතික

↓

ඒකඟතාවය





# ගිවිසුමක් ඇති විය හැකි ආකාර

ආකාර

- ලිඛිතව
- වාචිකව
- ව්‍යංගයෙන්

# ආදායම හඳුනාගැනීම
## පියවර 05 ආකෘතිය


Sandeepa Jayasekera - JMC 9

9

1. ගනුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම් හඳුනාගැනීම
2. ගිවිසුම් තුල ඇති කාර්ය සාධන බැඳීම් හඳුනාගැනීම
3. ගිවිසුමේ සමස්ත මිල තීරණය කිරීම
4. සමස්ත මිල කාර්ය සාධන බැඳීම් අතර විභජනය කිරීම
5. කාර්ය සාධන බැඳීම තෘප්තිමත් වූ පසු ආදායම හඳුනාගැනීම

Sandeepa Jayasekera - JMC 10

10




Sandeepa Jayasekera - JMC 11

11

# ප්‍රශ්න 01

- DSI සමාගම පාසල් පාවහන් විකිණීමේ නියැලී සිටී. 2018/10/31 වන දින DSI සමාගම විසින් රු. 1,500 ක් වටිනා පාසල් පාවහන් යුගලයක් විකුණන ලදී.
- මෙම ගනුදෙනුවට අදාළ කාර්යසාධන බැඳීම සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිළි කරන්න.

.

Sandeepa Jayasekera - JMC 12

12

# පිළිතුරු 01

| | |
|---|---|
| කාර්යසාධන බැඳීම | |
| මිල | |
| අයභාරය හඳුනාගැනීම | |





# ප්‍රශ්න 02

- Idea සමාගම උපදේශන සේවාවන්ගේ නිරත වී සිටී. පසිඳු විසින් සිය ව්‍යාපාර කටයුතු සඳහා සය මාසික උපදේශන සේවාවක් සඳහා ගිවිසුම් අත්සන් තබන ලදී. උපදේශන සේවාවේ මිල ගණන රු. 600,000 ක් ලෙස තීරණය කරන ලදී.
- ඉහත ගිවිසුමට අදාළව කාර්යසාධන බැඳීම් සහ එයට අදාල ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න.

# පියවර 01

# ගනුදෙනුකරු සමග ඇති ගිවිසුම් හඳුනාගැනීම





JMC vLearning your virtual learning partner

## පිළිතුරු 02

| | |
|---|---|
| කාර්යසාධන බැඳීම | |
| මිල | |
| අයභාරය හඳුනාගැනීම | |

| | | | |
|---|---|---|---|
| ගිවිසුම හඳුනාගැනීමට සම්පූර්ණ විය යුතු නිර්ණායක | වාණිජමය හරය | ගිවිසුම නිසා අනාගත මුදල්, අවදානම් වෙනස්වීම | |
| | අනුමත වීම | ලිඛිතව | |
| | | වාචිකව | |
| | | ව්‍යංගයෙන් | |
| | පාර්ශවයන්ගේ අයිතීන් | විකුණුම්කරු | මුදල් |
| | | පාරිභෝගිකයා | භාණ්ඩ සේවා |
| | ගෙවීම් කොන්දේසි | ගෙවන වේලාව | |
| | | වාරික | |
| | | දඩ හෝ දිරිදීමනා | |
| | අය කරගැනීමේ හැකියාව | | |

17

17

# පියවර 2

## පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාවන් හඳුනාගැනීම

Sandeepa Jayasekera - JMC

18

18

**බැඳීම**

- අදාළ භාණ්ඩය හෝ සේවාව පමණක් භාවිතා කිරීම තුලින් පාරිභෝගිකයා තෘප්තිමත් කළ හැකි ද?
- ගිවිසුමේ අනිකුත් බැඳීම් තුලින් වෙන් කර හඳුනාගත හැකි ද?

**ඔව්** → නිශ්චිත බැඳීමකි → වෙන වෙනම ගිණුම් තැබිය යුතුය

**නැත** → සම්බන්ධිත බැඳීමකි → ඒකරාශී කර තනි බැඳීමක් ලෙස ගිණුම් තැබිය යුතුය

19

19

# ප්‍රශ්න 03

රොසෙල් සමාගම ටයිල් විකිණීමේ නිරතව සිටී. 2021/01/01 වන දින රොසෙල් සමාගම විසින් රු 100,000/-ක් වටිනා ටයිල් තොගයක් විකුණන ලද අතර, එය පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කර දීමටද අතිරේකව එකඟවිය. ප්‍රවාහනය සඳහා රු 10,000/-ක් අය කරන ලදි.

- ඉහත ගනුදෙනුවට අදාළව කාර්යසාධන බැඳීම් හඳුනාගන්න
- එම බැඳීම් නිශ්චිත බැඳීම් ද සම්බන්ධිත බැඳීම් ද යන්න පැහැදිලි කරන්න

Sandeepa Jayasekera - JMC 20

20

# පිළිතුරු 03

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |





# ප්‍රශ්න 04

අබාන්ස් සමාගම වායු සමීකරණ විකිණීමේ නියැළී සිටී. 2019/03/01 දින අබාන්ස් විසින් වායු සමීකරණ අලෙවි ගනුදෙනුවකට එළැඹි අතර ඒ අනුව රු 1,000,000/- වටිනා වායු සමීකරණ විකිණීමටත්, එවා රු 10,000/-ක් අය කර පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කර දීමටත්, රු 20,000/-ක් අය කර වසරක් නඩත්තු කරදීමටත් එකඟ විය.

- ඉහත ගනුදෙනුවට අදාළව කාර්යසාධන බැඳීම් හඳුනාගන්න
- එම බැඳීම් නිශ්චිත බැඳීම් ද සම්බන්ධිත බැඳීම් ද යන්න පැහැදිලි කරන්න
- මෙම ආදායම් හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න

# පිළිතුරු 04

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |






පියවර 3

# ගනුදෙනුවෙහි මිල තීරණය කිරීම






JMC vLearning your virtual learning partner


භාණ්ඩ හෝ සේවා
විකුණුම්කරු
පාරිභෝගිකයා
මිල = ලබා ගැනීමට අපේක්ෂිත වටිනාකම
Sandeepa Jayasekera - JMC
25

25


මිල
ස්ථාවර
විචල්‍ය
වට්ටම්
දිරිදීමනා
පොළී
කාර්ය සාධන ප්‍රසාද
විචල්‍ය කොටස සියලුම කාර්ය සාධන බැඳීම් අතර බෙදාහැරිය යුතුය
Sandeepa Jayasekera - JMC
26

26

# ප්‍රශ්න 05

My Pc ආයතනය පරිගණක අලෙවියේ නියැලී සිටී. දමිත් විසින් තම ව්‍යාපාරය සඳහා පරිගණක 10 ක් මිලදී ගැනීම සඳහා My Pc ආයතනය සමඟ ගිවිසුමකට එළඹියේය.

එම ගිවිසුමට අනුව My Pc ආයතනය විසින් වසරක නඩත්තු කාලයක් සඳහා එකඟ විය.

එක් පරිගණකයක් රු. 100,000 ක් වූ අතර එක්වර පරිගණක 10 ක් මිලදී ගත් බැවින් 20% ක වට්ටමක් ලබා දෙන ලදී. නඩත්තු කාලයේ වටිනාකම රු. 250,000 ක් ද වේ.

- ඉහත ගනුදෙනුවට අදාළව කාර්ය සාධන බැඳීම් හඳුනාගන්න
- නිශ්චිත බැඳීම් සහ සම්බන්ධිත බැඳීම් වෙන් කරගන්න
- ඒ ඒ බැඳීම් සඳහා වටිනාකම් ගණනය කරන්න
- ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න



# පිළිතුරු 05

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |

# ප්‍රශ්න 06

OIT සමාගම මෘදුකාංග නිෂ්පාදනය හා අලෙවියේ නියුක්ත සමාගමකි. ඔවුන් විසින් ගිණුම්කරණ මෘදුකාංගයක් නිර්මාණය කළ අතර මෙම මෘදුකාංගය අලෙවිය සඳහා රු. 1,000,000 ක් ද වසරක සේවා කාලය සඳහා රු.500,000 ක් ද අය කරයි. අලෙවිය සහ සේවා කාලය යන දෙකම ලබාගන්නේ නම් රු.1,200,000 ක් අය කෙරේ.

- සමන් විසින් මෘදුකාංගය සහ අලෙවියෙන් පසු සේවාව යන දෙකම ලබා ගන්නා ලදී. මෙම ගණුදෙණුවට අදාල කාර්යසාධන බැඳීම්, ඒ ඒ බැඳීමේ වටිනාකම වටිනාකම සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න.



# පිළිතුරු 06


| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |

## පියවර 4

# ගනුදෙනුවෙහි මිල කාර්යසාධන බැඳීම්වලට බෙදා වෙන් කිරීම



31






32

# තනි විකුණුම් මිල යනු

භාණ්ඩය හෝ සේවාව

වෙන වෙනම විකුණන්නේ නම්

අය කරන මිල



33


# ගැලපුම් කරන ලද වෙළඳපල තක්සේරු ප්‍රවේශය

තරඟකරුවන්ගේ මිල + පිරිවැය ගැලපුම් + පළපුරුද්ද ආශ්‍රිත ගැලපුම් = ගලපන ලද වෙළඳපොළ මිල



34

# අපේක්ෂිත පිරිවැයට ආන්තිකයක් එකතු කල ප්‍රවේශය




Sandeepa Jayasekera - JMC 35

35

# අවශේෂ ප්‍රවේශය

**(මෙය භාවිතා කළ හැකි වන්නේ සීමිත අවස්ථාවන් වලදී පමණි)**

සමස්ත විකුණුම් මිල

− තනි විකිණුම් මිල

− ගලපන ලද විකුණුම් මිල

− පිරිවැය මත ලාභාන්තිකයක් එකතු කළ මිල

= අවශේෂ මිල

Sandeepa Jayasekera - JMC 36

36

# ප්‍රශ්ණ 07

JMC ආයතනය අධ්‍යාපන සේවා ලබාදීමේ නිරත වී සිටී. පහත පාඨමාලාවන් සඳහා කාර්යසාධන බැඳීම්, කාර්යසාධන බැඳීම් වල මිල ගණන් සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න.

<u>ව්‍යාපාරික ඉංග්‍රීසි පාඨමාලාව</u>

පාඨමාලා කාලය මාස 04 ක් වන අතර සමස්ත අය කිරීම රු. 15,000 ක් වේ. පාඨමාලා කාලය තුල දේශන දායකත්වය, ශාලා පහසුකම්, රු. 1,000 ක් වෙළඳපොල මිල වන නිබන්දනය, එක් දින ප්‍රායෝගික පුහුණු වැඩමුළුව, ක්ෂේත්‍ර චාරිකාව යනාදිය ඇතුලත් වේ. එක්දින ප්‍රායෝගික වැඩමුළුව සහ ක්ෂේත්‍ර චාරිකාවට පමණක් සම්බන්ධ වන්නේ නම් රු. 3,000 ක් හා රු. 4,000 ක් අය කෙරේ

<u>වරලත් ගණකාධිකරණ පාඨමාලාව</u>

මාසික පාඨමාලා ගාස්තුව රු. 2,500 ක් වන අතර සමස්ත පාඨමාලා කාලය මාස 06 ක් වේ. පාඨමාලා කාලය තුල දේශන දායකත්වය, ශාලා පහසුකම් සහ නිබන්දන ලබා දීමට JMC ආයතනය කටයුතු කරයි. නිබන්දන කට්ටලය සඳහා රු. 2,000 ක පිරිවැයක් වැය වන අතර JMC ආයතනය 15% ක ලාභ ප්‍රතිශතයක් අපේක්ෂා කරයි.





# පිළිතුරු 07

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |

පියවර 5

# කාර්යසාධන බැඳීම තෘප්තිමත් වූ පසු අයභාරය හඳුනා ගැනීම





JMC vLearning
your virtual learning partner

## ආදායම හඳුනාගත යුත්තේ කුමන අවස්ථාවේද?

විකුණුම්කරු → භාණ්ඩ/සේවා පාලනය මාරු වන අවස්ථාවේදී → පාරිභෝගිකයා

- නිශ්චිත මොහොතක
- කාලයක් පුරාවට

# පාලනය

- ආර්ථික ප්‍රතිලාභ
  - 100% පාහේ භුක්ති විඳී
  - අන් අය භුක්ති විඳීම වළකයි
- වත්කමේ භාවිතය
  - තීරණය කරයි
  - අන් අය භාවිතා කිරීම වළකයි





| | | |
|---|---|---|
| පාලනය මාරු වීම | නිශ්චිත මොහොතක | භෞතික සන්තකය මාරු වීම |
| | | පාරිභෝගිකයා වත්කම පිළිගෙන තිබීම |
| | | අවදානම් සහ ප්‍රතිලාභ මාරු වීම |
| | | නෛතික අයිතිය මාරු වීම |
| | කාලයක් පුරාවට | භාණ්ඩ/සේවා ලබා දීම සහ පරිභෝජනය එකවර සිදුවීම |
| | | වත්කම පාරිභෝගිකයාගේ පාලනය තුල පැවතීම |
| | | විකල්ප භාවිත නොමැති වීම සහ ගෙවීම් ලබාගැනීමට අයිතියක් පැවතීම |

# ප්‍රශ්න 08

නාමල් සමාගම මෘදුකාංග නිර්මාණයේ නියැලී සිටී. චතුර සමාගම විසින් සිය ආයතනයේ වැටුප් පිළියෙල කිරීම සඳහා මෘදුකාංගයක් තැනීමට නාමල් සමාගම සමඟ ගිවිසුමකට එළඹන ලදී. එම ගිවිසුමට අනුව මෘදුකාංගය නිර්මාණය කිරීම, දෘඩාංග මිලදී ගැනීම, සේවකයන් පුහුණු කිරීම සහ වසරක සේවා කාලයක් ලබා දීමට නාමල් සමාගම එකඟ විය.

සමස්ත මෘදුකාංග ගිවිසුමේ වටිනාකම රු. 1,000,000 ක් විය. නාමල් සමාගම මෙම සේවාවන් වෙන වෙනම ලබා දෙන්නේ නම් වෙළඳපොල මිල ගණන් පහත පරිදි වේ.

Sandeepa Jayasekera - JMC 43

43

# ප්‍රශ්න 08

| | |
|---|---|
| මෘදුකාංගය නිර්මාණය කිරීම | 400,000 |
| දෘඩාංග මිලදී ගැනීම | 400,000 |
| සේවකයන් පුහුණු කිරීම | 100,000 |
| සේවා කාලය වසරක් සඳහා | 100,000 |

මෙම සමාගම 2021/01/01 දින මෘදුකාංගය නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර එය 2021/03/01 දින වන විට අවසන් විය. 2021/03/05 වන දින දෘඩාංග මිලදී ගත් අතර මෘදුකාංග ඇතුලත් කරන ලද දෘඩාංගයක් 2021/03/15 වන දින චතුර සමාගමේ කාර්යාලය තුල ස්ථාපනය කරන ලදී. එදින සිට පුරා සතියක් සේවකයන් පුහුණු කළ අතර 2021/03/22 සිට 2022/03/22 තෙක් වසරක කාලය සඳහා සේවා පහසුකම් ලබා දීමට එකඟ වන ලදී කාර්යසාධන බැඳීම්, කාර්යසාධන බැඳීම් වල මිල ගණන් සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න.

Sandeepa Jayasekera - JMC 44

44

# පිළිතුරු 08

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |





# පිළිතුරු 08

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| සම්බන්ධිත බැඳීම් | | | |

# ඉදිරිපත් කිරීම

- ලාභලාභ ගිණුම
  - අයහාරය
- මූල්‍ය තත්ව ප්‍රකාශය
  - ජංගම වත්කම්
    - පාරිභෝගිකයාගෙන් ලැබිය යුතු ශේෂය
  - ජංගම වගකීම්
    - පාරිභෝගිකයාගෙන් ලද අත්තිකාරම්

Sandeepa Jayasekera - JMC 47

47

# හෙළිදරව් කිරීම්

- ගිවිසුම් වත්කම් සහ ගිවිසුම් වගකීම්
  - ආරම්භක ශේෂ
  - අවසාන ශේෂ
  - බැඳීම් පිළිබඳ තොරතුරු
- අයහාරය
  - විවිධ වර්ග වලින් ජනනය වූ අයහාරය
- විනිශ්වයන්
  - විනිශ්වයන්ගේ වෙනස්වීම්
  - මිල බෙදා වෙන් කිරීම
  - අයහාරය හඳුනාගන්නා අවස්ථාව

Sandeepa Jayasekera - JMC 48

48